# සාමාන්‍ය සමයේ විසිවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

විනිශ්චයකාරයන්ගෙන් ගත් පාඨයෙකි.

විනිශ්චයකාරයෝ 9: 6-15

දෙවි සමිඳාණෝ ඔබ රජාණන් වන සේක.

ෂෙකෙම්හි සියලු වැසියෝ ද මිල්ලෝහි සියලු වැසියෝ ද එක්ව ගොස් ෂෙකෙම්හි තිබුණු කණුව අසල ආලෝන වෘක්ෂය ළඟ දී අබිමලෙක් රජකමට පත් කළෝය.

මේ කරුණ ගැන ජෝතාම්ට දැන්වූ විට ඔහු ගොස් ගෙරිසීම් කන්ද පිට මොරගසමින් මෙසේ කීවේය. "ෂෙකෙම්හි වැසියෙනි, දෙවියන් වහන්සේ ඔබට සවන් දෙන පිණිස, ඔබ මට සවන් දෙන්න. එක් කලෙක වෘක්ෂයෝ තමන් කෙරෙහි රජෙකු පත් කර ගන්නට ගියහ. ඒ වෘක්ෂයෝ, 'ඔබ අප කෙරෙහි රජෙකු රජ වුණ මැනවැ'යි ඔලීව වෘක්ෂයට කීහ. ඔලීව ගස ඒ වෘක්ෂයට පිළිතුරු දෙමින්, 'දෙවියන් වහන්සේට ද මනුෂ්‍යන්ට ද ගෞරව කරන්නට පාවිච්චි කරන මාගේ තෙල් අත්හැර ඔබ කෙරෙහි රජ කරන පිණිස යාම මට යුතු දැ'යි ඇසීය. එවිට වෘක්ෂයෝ, 'ඔබ අවුත් අප කෙරෙහි රජ වුණ මැනවැ'යි අත්තික්කා ගසට කීහ. අත්තික්කා ගස ඒ වෘක්ෂයන්ට පිළිතුරු දෙමින්, 'ඔබ කෙරෙහි රජ කරන පිණිස මාගේ හොඳ පල ද එහි මිහිර ද අත්හැරීම යුතු දැ'යි ඇසීය. එවිට වෘක්ෂයෝ, 'ඔබ අවුත් අප කෙරෙහි රජ වුණ මැනවැ'යි මිදි වැලට කීහ. මිදි වැල පිළිතුරු දෙමින් ඔබ කෙරහි රජකම් කරන පිණිස, මා දෙවිවරුන් සහ මනුෂ්‍යයන් ප්‍රීති කරවන මාගේ මිදියුස අත්හැරීම යුතුදැ'යි

ඇසීය. එවිට සියලු වෘක්ෂයෝ, 'ඔබ අවුත් අප කෙරෙහි රජ වුණ මැනවැ'යි කටුඇඹිල්ල ගසට කීහ. එවිට කටුඇඹිල්ල ගස පිළිතුරු දෙමින්, 'ඔබ සැබෑවට ම ඔබ කෙරෙහි රජෙකු කොට මා පත් කරගන්නහු නම්, අවුත් මාගේ සෙවණෙහි රැකවරණය ලබා සිටින්න. එසේ නොකළොත් කටුඇඹිල්ල ගසෙන් ගින්නක් නික්ම ලෙබනොන්හි කිහිර ගස් දවාලන්නේ යැ'යි වෘක්ෂයන්ට කීවේය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 21 : 1 – 6

පිළිතුරු: සමිඳුනි, ඔබ වහන්සේගේ ශක්තිය අපේ ආනන්දය ය.

ගීය:

සමිඳුනි, ඔබේ බල පැරකුම් ගැන රජ තෙමේ උදන් අනයි. ඔබ දුන් විමුක්තිය ගැන ඔහු කොතරම් ප්‍රමෝද වන්නේ ද?
ඔබ ඔහුගේ මන දොළ පුරවා ලූ සේක. ඔහුගේ යාඥනි නොපිරිහෙළා ඉටු කළ සේක.

ඔහු සැප සම්පත් රැගෙන ඔහු වෙත එන සේක. ඔහුට පිවිතුරු රන් කිරුළක් පළඳවන සේක. ඔහු ඔබෙන් දිව සම්පත අයැදි ය. ඔහුට එය දුන් සේක. දීගායු ද ප්‍රදානය කළ සේක.

ඔබෙන් ලත් විමුක්තිය රජුට යස ඉසුරු ගෙන දෙයි. කීර්තිය හා ප්‍රතාපය ඔබ ඔහුට දෙන සේක.
ඔබට ඔහුට සදහට ම ඉමහත් ආසිරි දානය කරන සේක.

ඔබ ඔහු සමඟ සිටීමෙන් ඇතිවන ප්‍රීතියෙන් ඔහු පිනවන සේක.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, දයාවෙන් අප දෙස බැලුව මැනව.
ඔබ වහන්සේගේ පණත් අපට ඉගැන්නුව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේගේ වචනය ජීවමාන ය. ක්‍රියාශීලී ය.
සිතේ සිතුවිලි ද අරමුණු ද විමසන්නේ ය.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 20 : 1-16

"මා කාරුණික බැවින් ඔබ ඊර්ෂ්‍යා වන්නේ මන් ද?"

ජේසුස් ස්වාමීන් වහන්සේ මෙසේ ද වදාළ සේක. "ස්වර්ග රාජ්‍යය වූ කලි තමාගේ මිදි වත්තට කුලීකරුවන් ගන්නා පිණිස එක් දිනක් අලුයම පිටත්ව ගිය ඉඩම් හිමියෙකුට සමාන ය. ඔහු දිනකට රිදීකාසියක් බැගින් ගෙවීමට කුලීකරුවන්ට පොරොන්දු වී තමාගේ මිදි වත්තට ඔවුන් යැවීය. උදේ නවයට පමන ඔහු පිටත්ව ගොස්, කඩ මණ්ඩියේ වැඩක් නැතිව සිටි තවත් අය දැක, 'ඔබත් මිදි වත්තට යන්න, සෑහෙන කුලියක් ඔබට දෙමි'යි කීය. ඔව්හු වැඩට ගියහ. නැවත මද්දහනේ දී ද අපරභාග තුනට පමණ ද ඔහු පිටත්ව ගොස් එසේ ම කළේය. සවස පහට පමන ද පිටත්ව ගොස් එහි තවත් අය සිටිනු දැක, 'ඔබ මෙතැන දවස තිස්සේ නිකම් සිටින්නේ මන්දැ'යි ඔවුන්ගෙන් ඇසීය. 'කිසිවෙකු අපට වැඩට නොගත් නිසා ය'යි ඔව්හු කීහ. 'ඔබත් මිදි වත්තට යන්නැ'යි ඔහු ඔවුන්ට කීය.

"සවස් වූ කල මිදි වත්ත හිමියා සිය කළමණාකාරයාට කතා කොට, 'කුලීකරුවන් කැඳවා අන්තිමට ආ අයගෙන් පටන් ගෙන පළමු වැන්නා දක්වා ඔවුන් හැමට කුලිය ගෙවන්නැ'යි කීය. එවිට සවස පහට පමණ වැඩට ආ අය අවුත් එක එක මිනිසා රිදී කාසිය බැගින් ලැබූහ. මුලින්ම වැඩට ගිය අය ආ විට තමන්ට ඊට වැඩියෙන් ලැබෙනු ඇතැයි සිතූහ. එහෙත් ඔව්හු ද එක එක මිනිසා රිදී කාසියක් බැගින් ලැබූහ. එසේ ලැබූ ඔව්හු ඉඩම් හිමියාට විරුද්ධව දොස් කියමින් 'මේ අන්තිමට ආ අය වැඩ කළේ එක පැයක් පමණි. එහෙත් අවු රස්නය නොබලා මුළු දවසේම වෙහෙස මහන්සි වූ අපටත් ඔබ රිදී කාසියක කුලිය ම ගෙවන්නෙහි ය'යි

කීහ. එහෙත් ඔහු ඔවුන්ගෙන් කෙනෙකුට උත්තර දෙමින්, 'යහළුව, මා ඔබට අයුත්තක් කරනවා නොවේ. ඔබ මා සමග රිදී කාසියක කුලියට එකග වුණා නොවේ ද? ඔබට දුන් කුලිය රැගෙන යන්න. ඔබට ගෙවූ ලෙස ම මේ අන්තිමයාටත් ගෙවීම මාගේ කැමැත්ත ය. මා සන්තක දෙයින් මා කැමැති දෙයක් කිරීමට මට අයිතියක් තිබෙනවා නොවේ ද? මා කාරුණික බැවින් ඔබ ඊර්ෂ්‍යා වන්නේ මන්දැ'යි ඇසීය. මෙසේ අන්තිමයෝ ප්‍රථමයෝ ද ප්‍රථමයෝ අන්තිමයෝ ද වන්නෝ ය."

සුවිශේෂ වාක්‍යය එසේය.